# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2302/31 - 2022 ඔක්තෝබර් මස 21 වැනි සිකුරාදා - 2022.10.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උප වගන්තිය සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මවිසින් සාදනු ලබන රෙගුලාසි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 20 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

රෙගුලාසි

1. මෙම රෙගුලාසි **"2022 අංක 18 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි"** ලෙස හඳුන්වනු ලැබේ.

2. සංශෝධිත, 2021 ජූනි මස 11 දිනැති අංක 2231/18 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2021 අංක 10 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි, මෙමගින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

   2.1 ඉහතින් සඳහන් කළ 2021 අංක 10 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල අංක 8 දරන රෙගුලාසියේ කෙසේ සඳහන් වුවද, එම රෙගුලාසිවල **I** වන උපලේඛනයේ ලැයිස්තුගත කර ඇති කැඩුණු සහල් **(එච්. එස්. කේතය 1006.40.00)**, කෘෂිකර්ම විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ පූර්ව නිර්දේශය මත, සත්ත්ව ආහාර නිෂ්පාදනය සඳහා ආහාර ප්‍රවර්ධන මණ්ඩලය විසින් හෝ ආහාර ප්‍රවර්ධන මණ්ඩලය වෙනුවෙන් ආනයනය කිරීම සඳහා ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අවසර ලබා දෙනු ලැබේ. මුළු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 25,000ක් සඳහා පමණක් අවසර ලබා දෙනු ලැබේ.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉහත අංක 2.1 දරන රෙගුලාසි උල්ලංඝනය කරමින් සිදුකරන ඕනෑම ආනයනයක් සම්බන්ධයෙන් කෘෂිකර්ම විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් උපදෙස් ලබා ගත යුතුය.

4. ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් මෙම රෙගුලාසි ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත සහ බලපත්‍රලාභී බැංකු වෙත සුදුසු "මෙහෙයුම් උපදෙස් " නිකුත් කරනු ලැබේ.

EOG 10 - 0238

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.